# මහනුවර, අංකුඹුර මීසාන් තේ කර්මාන්ත ශාලාවේ කාර්මික උරුමය

කේ.එම්.ඊ.ද සිල්වා
සිව් වැනි වසර, පුරාවිද්‍යා ශාස්ත්‍රවේදී (විශේෂ)
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය
*eranga123.eds@gmail.com*

## හැඳින්වීම

කාර්මික පුරාවිද්‍යාව යනු නුදුරු අතීතයේ කර්මාන්ත, සන්නිවේදන හා තාක්ෂණික ප්‍රවණතාවයන් පිළිබඳ ව අධ්‍යයනය කරන පුරාවිද්‍යාවේ උප විෂයයකි. දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියනු ලබන ශ්‍රී ලාංකේය කාර්මික පුරාවිද්‍යාව විෂයය පථය අයත් වනුයේ ක්‍රි.ව. 1800-1950 කාලය ඇතුළත් ආදි නූතන අවධියට ය. පූර්ව කාල පරිච්ඡේදයට අයත් කාර්මික ප්‍රවණතාව නිසා ශ්‍රී ලංකාවට අදාළ වූ 'කාර්මික උරුමය" අතර වැවිලි කර්මාන්තය හා බැඳුන ස්ථාන, ස්මාරක හා යන්ත්‍ර සූත්‍ර ප්‍රමුඛ වේ. ශ්‍රී ලංකාවේ තේ වගාවේ මූලාරම්භක අවධියට අයත් වූ මහනුවර අංකුඹුර මීසාන් තේ කර්මාන්ත ශාලාව හා ඒ ආශ්‍රිත කාර්මික උරුමය පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

## පූර්ව අධ්‍යයන

මහනුවර අංකුඹුර මීසාන් තේ කර්මාන්ත ශාලාවේ කාර්මික උරුමය පිළිබඳ පූර්ව අධ්‍යයන පිළිබඳ ව තොරතුරු සෙවීමේ දී ද මෙතෙක් කිසිවෙකුත් ඒ පිළිබඳ ව පර්යේෂණ සහ අධ්‍යයනයන් සිදු කර ඇති බවට වාර්තා නොවේ.

## ඓතිහාසික පසුබිම

අංකුඹුර මීසාන් තේ කර්මාන්ත ශාලාව පිහිටා ඇත්තේ මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ අංකුඹුර නම් කුඩා නගරයෙහි ය. මෙම තේ කර්මාන්ත ශාලාවේ 1946 දී මීසාන් හජ්ජියාර් විසින් මිලට ගෙන ඇත. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් 1974 අගෝස්තු මාසයේ දී රජයට පවරා ගන්නා ලදී. නමුත් 1990 දී නැවතත් මෙම තේ කර්මාන්ත ශාලාව මීසාන් සමාගම යටතට ගැනීමට හැකියාව ලැබුණි. වර්තමානයේ මෙහි අධිපතිත්වය දරන්නේ ඉහිතිශාම් මීසාන් මහතා විසිනි.

## ක්‍රමවේදය

මූලික ක්‍රමවේදය ලෙස මෙම අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබුවේ ක්ෂේත්‍ර අධ්‍යයනයයි. ක්ෂේත්‍ර ගවේෂණයට පිවිසීමට පෙර ක්ෂේත්‍ර නොවන ගවේෂණයක් සිදු කරන ලදී. ඒ අනුව තේ නිෂ්පාදන ක්‍රියාවලිය සහ ඒවාට යොදාගන්නා යන්ත්‍ර පිළිබඳ ව

මූලික අවබෝධයක් ලබා ගැනීම මෙහි දී සිදුවිය. ඒ අනුව ද්විතීයික දත්ත ලබා ගැනීම සඳහා මූලාශ්‍ර අධ්‍යයනයක් සිදුකරන ලදී.

**සාකච්ඡාව**

තවමත් වර්තමානයේ භාවිතා වන සහ අතීතයේ භාවිතා කළයන්ත්‍ර සහ උපකරණ මෙම තේ කර්මාන්ත ශාලාවේ දක්නට ලැබේ. ඒ අනුව එම කාර්මික උරුමයන් පහත පරිදි පෙන්වාදිය හැකි ය.

- **බිම් තරාදිය**

ක්ෂේත්‍රයේ තේ දලු කැඩීමෙන් පසු ව දලුවල ප්‍රමාණවල බර ඒ ස්ථානවලදී ම මැන බලනු ලැබේ. එහි දී දලු කූඩයේ හෝ බෑගයෙහි බර හැර දලුවල බර සඳහන් කර ගනු ලැබේ. එහි දී දලු කූඩයේ හෝ බෑගයෙහි බර හැර දලුවල බර සඳහන් කර ගනු ලැබේ. දෙපසට ඇති තරාදි පියන් ද්වයකින් මෙහි එක් පසෙක තාරාදි පියනට යටින් වූ කොටසට රෝද සවිකර තිබේ. මෙය ඕනෑ ම දිශාවනට චලනය කළ හැකි ය. (ද සිල්වා :2005: 128) මෙම කර්මාන්ත ශාලාවේ බිම් තරාදි දෙකක් දක්නට ලැබෙන අතර එම බිම් තරාදි දෙක ම නිෂ්පාදනය කර ඇත්තේ VANDOME TITIORE AND CO: LIMITED නම් ආයතනය විසිනි. නමුත් එම ආයතනය අයත් රට සඳහන් නොවේ. වර්තමානයේ දී මෙම බිම් තරාදිය එදිනෙදා කිරුම් මිනුම් සඳහා භාවිතයට නොගන්නා අතර මෙය තේ කර්මාන්ත ශාලාවේ ම කොටසක ප්‍රදර්ශනය කොට ඇත.

- **ඕතොඩොක්ස් ඇඹරුම් යන්ත්‍රය**

මෙය දලු දමන විවරය, පීඩක පියන, කුටීරය, ඇඹරුම් මේසය, ඇඹරුම් මේසයෙහි මධ්‍ය කොටස හා කුඩු පිට කරන දොරටුව වශයෙන් කොටස් කළ හැකි ය. මේ අඹරුම් යන්ත්‍රය වෙතට දලු එවීම සඳහා උඩු මහලේ සිට ඇඹරුම් යන්ත්‍රය වෙත සුදු දිග රෙදි පටියක් යොදා තිබේ. මැලවීමට ලක්කරන ලද දලු එහි සිට කුහරයට දැමූ විට එය යන්ත්‍රය තුළට ලබාදේ. මෙය දලු යන්ත්‍රයට ඇතුළු කිරීමේ පහසුම ක්‍රමයකි. පීඩන පියන මගින් ඇති කරනු ලබන තෙරපී මහා භ්‍රමණය හේතුවෙන් දලු කොටස්වලට කැඩීම සිදුවේ. බර ප්‍රමාණ අනුව විවිධ ඇඹරුම් යන්ත්‍ර මගින් තේ දලු කුඩුවීම විවිධ ප්‍රමාණවලට සිදුවේ. (ද සිල්වා :2005:134) මෙම යන්ත්‍රයේ නිෂ්පාදන ආයතනයක් ගැන සඳහන් නොවන අතර '**cCc**' යනුවෙන් ලාංඡනයක් ඇත. එය Colombo Commercial Company යන්නෙහි කෙටි යෙදුම වේ.

- **රොටවේන් ඇඹරුම් යන්ත්‍රය**

මෙම යන්ත්‍රය සඳහා ද දලු ඇතුලු කරන දොරටුවක්, දලු කැබලි ඉදිරියට යවන කොටසක්, කුටීරය, පංකා පෙති ආදි කොටස් ද තේ කුඩු පිට කරන කොටස් ද අන්තර්ගත වේ. මේ යන්ත්‍රයෙහි බාහිර ස්වරූපය ද අභ්‍යන්තර ක්‍රියාකාරිත්වය ද ඕතොඩොක්ස් ඇඹරුම් යන්ත්‍රයෙන් වෙනස් වේ. (ද සිල්වා :2005:136) මෙම යන්ත්‍රය බහුලව ම යකඩ භාවිතා කරමින් තිපදවා ඇත. මෙම යන්ත්‍රයේ 'TIVANE' යනුවෙන් නිෂ්පාදන ආයතනය සදහන් කර ඇත. මීට

අමතරව තේ දලු ඇඹරීම සඳහා තවත් ඇඹරුම් යන්ත්‍රයක් තිබී ඇති අතර එය ද වර්තමානයේ භාවිතයට නොගන්නා අතර එහි නිෂ්පාදන ආයතනය ලෙස "THE BENTALL AND CO: LTD; ENGLAND" යනුවෙන් සඳහන් ව ඇත.

- **බල උත්පාදන යන්ත්‍රය**

අතීතයේ දී මෙම තේ කර්මාන්ත ශාලාව සඳහා බලය උත්පාදනය කර ඇත්තේ ඩීසල් භාවිතයෙන් ක්‍රියා කරන බල උත්පාදන යන්ත්‍රයකිනි. මෙම යන්ත්‍රය නිපදවා ඇත්තේ එංගලන්තයේ Crompton Pakinson සමාගම විසිනි. කටයුතු සඳහා ද භාවිතා කළ පැරණි දුරකථන දෙකක් ද දක්නට ලැබෙන අතර මේවා වර්තමානයේ ප්‍රදර්ශනය සඳහා තබා ඇත. මෙම දුරකථනයන් ඉතා ම අබලන් තත්ත්වයේ පවතින හෙයින් මෙහි නිෂ්පාදන ආයතනය හා රට සොයාගත නොහැකි ය.

එසේ ම හදිසි තත්ත්වයක දී භාවිත කළ හැකි ගිනි නිවන උපකරණයක් ද දක්නට ලැබේ. එහි නිෂ්පාදන ආයතනය 'THE STREAMLINE FILTER CO: LTD' ලෙස සඳහන් ව ඇත. මෙම ආයතනය බ්‍රිතාන්‍ය ලන්ඩන් නුවර 1923 දී ආරම්භ කර ඇත.

## සමාලෝචනය

මහනුවර අංකුඹුර මීසාන් තේ කර්මාන්ත ශාලාවේ කාර්මික උරුමයන් බොහොමයක් දක්නට ලැබේ. ඒ අනුව ආරම්භයේ සිට ම පැවති යටත් විජිත බලපෑම මැනවින් විදහා දැක්වීමක් මෙයින් පෙන්නුම් කෙරේ. කාර්මීකරණයත් සමඟ වූ යන්ත්‍ර සූත්‍රයන්ගේ ප්‍රභවය මෙහි දී විද්‍යමාන වේ. වර්තමානයේ දී මෙහි පැරණි යන්ත්‍ර හා උපකරණ මනාව පිළිවෙළකට ප්‍රදර්ශනය සඳහා තබා ඇති අතර කාර්මික උරුමස්ථානයක් ලෙස මහනුවර අංකුඹුර මීසාන් තේ කර්මාන්ත ශාලාව මේ අනුව වැදගත්කමක් උසුලයි.

## පරිශීලන ග්‍රන්ථ නාමාවලිය

සිල්වා, ද. රසාංගිකා. (2005) ***ශ්‍රී ලංකාවේ තේ ඉතිහාසය:*** ජාඇල සමන්ති පොත් ප්‍රකාශකයෝ.